01 කල් ඉකුත්වීමේ නීතිය (කාලාවරෝධය) යනු කුමක්ද?

කාලසීමා නීතිය පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත්ව සිටීම ඉතා වැදගත් වන අතර නියමිත කාලසීමාව තුළ අධිකරණයේ සහන ඉල්ලීමක් කළ යුතු අවස්ථාවක එකී කාලසීමාව ඉකුත්වූ පසු එම කරුණ සම්බන්ධයෙන් පිළිසරණ පැතිය හොහැකි වේ.

- කාලාවරෝධී ආඥා පනතේ 04 වගන්තිය යම්කිසි නිශ්චල දේපළක බුක්තිය දරන්නකු එකී සන්තකය තීන්දනුගුලු හොවන ආකාරයෙන් බැහැර කරනු ලැබුවහොත් එසේ කමකින් සන්තකය අහිමි කරනු ලැබූ තැනැත්තාට එරෙහිව එකරන් ඇතැළත නඩුවක් පවරවිය හැකිය.
- හවුල් වාසපාර ගිවිසුම්, පොරොන්දු හෝවිලු, විනිමය බිල්පත් හෝ ලිඛිත පොරොන්දු ගිවිසුම් වැනි ලිඛිත ගිවිසුම්කය කොන්දේසි ක්‍රියාත්මක කරවා ගැනීමට අවශ්‍ය නම් එකී ගිවිසුම්මය කොන්දේසි කඩ කළ දින සිට වසර 06ක් ඇතුළත නඩු පවරවිය යුතුය.
- කාලාවරෝධී ආඥා පනතේ 07 වගන්තිය වංචාල දේපළක් සම්බන්ධයෙන් මෙම වගන්තිය බොහෝ විට අදාළ වන අතර ලිඛිත ඇපකරයක් හැසිව දුන් ණය මුදලක් ආපසු ලබා ගැනීම පිණිස පවරන නඩුවු ලිඛිතව ඇතිකරගත් පොරොන්දුවක් හෝ ගිවිසුම් එකතකතාවක් කඩකළ විටකදී ද එම කොන්දේසි ඉටු කරවා ගැනීමේදී පවරන නඩුවු මෙම වගන්තියෙන් ආවරණය වේ. මේ ආකාරයේ සියලු නඩු වසර 03ක් ඇතුළත පැවරිය යුතු අතර එසේ නොවුණහොත් එම නඩු කාලාවරෝධී වේ.
- විකුණන ලද භාණ්ඩයකට ලැබිය යුතු මුදල්, ඉලුක්කරන ලද සේවයකට ලැබිය යුතු වේතනය ඇයකර ගැනීමට නම් අදාළ මුදල ලැබිය යුතු දින සිට වසරක් ඇතුළත නඩු පවරවිය යුතුය.
- කිසියම් අලාභයක් හෝ හානියක් සිදුවූ තැනැත්තකු ඒ නඩු නිමිත්ත උද්යතවූ දින සිට වසර 02ක් ඇතුළත එකී අලාභය ඇයකරවා ගැනීමට නඩු පවරවිය යුතුය.
- කාලාවරෝධී ආඥා පනතේ 15 වගන්තියට අනුව, කාලාවරෝධී ආඥා පනත රජයේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් හා දීක්සසාදු නඩු සම්බන්ධයෙන් බලපාන්නේ නැත.
- වෘවස්ථාව මඟින් දක්වන මූලික අයිතිවාසිකම් කඩ වූ අවස්ථාවක අදාළ ඉල්ලීම කඩවීමෙන් හෝ ඊට ආසන්නතම හේතුව උද්ගතවීමේන් මාස 01ක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකාරණය වෙත පෙත්සමක් ඉදිපිපත් කළ යුතුය.

02 අභියාචනාවන්ට අදාළ කාලාවරෝධී නීතිමය තත්ත්වය කෙබඳුද?

- සිවිල් නඩු විධාන සංග්‍රහයේ 755 (3) වගන්තියට අනුව සෑම අභියාචකයකු විසින්ම තම අභියාචන පෙත්සම නඩු තීන්දුවේ දින සිට දින 60ක් ඇතුළත මුල් අධිකරණය වෙත ඉදිපිපත් කළ යුතුය.
- මෙපෙත්තුත් අධිකරණ තීන්දුවකින් අතෘප්තියට පත් පාර්ශ්වයකට එකී තීන්දුවේ දින සිට දින 14ක් ඇතුළතදී නීතිපතිවරයා මාර්ගයෙන් නම් දින 28ක් ඇතුළතදී මහාධිකරණය වෙත අභියාචනා කළ යුතුය.
- කම්සාරං විනිශ්චය සභාවල තීන්දුවකින් අතෘප්තියට පත්වන්නකුට එම නියෝගයේ සිට දින 30ක් ඇතුළත මහාධිකරණය වෙත අභියාචනා කළ යුතුය.
- ගෙවල් කුලී මණ්ඩලයේ සිට ගෙවල් කුලී සමාලෝචන මණ්ඩලය වෙත දින 21ක් තුළ අභියාචනා කළ යුතුය.
- අභියාචනාධිකරණ අවසර ලබාගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයන් (CALA) අවසාන තීන්දුව දුන් දිනසිට වාර්තාව අවසර ලබා ගැනීම කෝ තීන්දුව දුන් දින සිට දින 2ක් ඇතුළත එකී ඉල්ලීම සඳහා බැලීම සඳහා අයැදිය යුතුය.
- අභියාචනාධිකාරණය විසින් දෙන ලද තීරණයක් හෝ පළාත්තීරු සිවිල් අභියාචනාධිකාරණය විසින් දෙන ලද තීන්දුවකට එරෙහිව අදාළ තීන්දුව දුන් දින සිට සති 06ක් දින 42ක් ඇතුළත එකී ඉල්ලීම ශ්‍රේෂ්ඨාධිකාරණය වෙත ඉදිපිපත් කළ යුතුය.

03 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යනු කුමක්ද?

තම මහලු මවුපියන් නඩත්තු කිරීම සෑම දරුවකුගේම යුතුකමක් පමණක් නොව රාජකීය ධර්මයක් වේ. එකී ගුණධර්මය පැහැරගරන්නා වූ තැනැත්තන්ගේ මවුපියන්ගේ යහපත පිණිස ඉතා කී පනත ස්ථාපිතකොට ඇති අතර දරුවන් නොමැතිව හෝ අනාථවූ දෙන්නා වැඩිහිටියකු රැකබලා ගැනීම රජයේ යුතුකමක් ලෙසටද පිළිගෙන ඇත.

ඒ අනුව ඉහත පනත මඟින් වැඩිහිටියන් වෙනුවෙන්ම වැඩිහිටි නඩත්තු ඉල්ලීම් මණ්ඩලය ස්ථාපිත කොට ඇත.

04 වැඩිහිටි නීතියට අනුව නඩත්තු ලබාගත හැක්කේ කාගෙන්ද?

වීයපත් මවකට හෝ පියකුට තමාගේම දරුවකුගෙන් මෙන්ම තමන් විසින් හදාවඩා ගත් දරුවකුගෙන් වුවද නඩත්තු මුදලක් ලබාගත හැකිය. එසේම නඩත්තු ඉල්ලීම එක් දරුවකුට එරෙහිව හෝ දරුවන් කීපදෙනකුට එරෙහිව වුවද සිදු හැකිය.

දරුවන් එක් අයකු හෝ වැඩි ගණනක් සිටියදීත් ස්වකීය නඩත්තුව තමා විසින්ම පසුගතත නොහැකි වැඩිහිටි මවුපියකුට නඩත්තු ඉල්ලීමක් මෙම මණ්ඩලය වෙත ඉදිපිපත් කළ හැකිය.

05 මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය කෙබඳුද?

ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාපෘතිව ඇති සමට මණ්ඩලය මෙන් සුභද ආකාරයේ තනතුරක් ඉල්ලන්නන් කරා එළැඹෙන මෙම කුමය යටතේ පාර්ශ්වයන් අතර එදිවසදීකම් අයිතිමිනට අවස්ථාවක් ඇති නොකෙළේ, එසේ නෙයින් සතුටින් රැස්වී, සතුටින් විසිර යෑම වැනි අධිකරණ ක්‍රියාවලියක දැකිය නොහැකි සුවිශේෂී ලක්ෂණ මෙම වැඩිහිටි ක්‍රියාවලිය තුළ දක්නට ඇත.

06 වැඩිහිටි ඉල්ලීම් මණ්ඩලයට තම දුක්ගැනවිල්ල ඉදිරිපත් කරන්නේ කෙසේද?

අදාළ ආකෘති පත්‍රයේ දක්වා ඇති තොරතුරු සම්පූර්ණ කර වැඩිහිටි නඩත්තු ඉල්ලීම් මණ්ඩලය වෙත සිය ඉල්ලීම ඉදිපිපත් කළ හැකිය.

වැඩිහිටි නඩත්තු මණ්ඩලයේ ලිපිනය:

සහාපතිතුමා,
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු ඉල්ලීම් මණ්ඩලය,
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය,
2 වැනි මහල, ඩී. කොටස,
සෙත්සිරිපාය,
2 වැනි අදිකර,
බත්තරමුල්ල
දුරකථන: 011-2054136, 011-2054164
ෆැක්ස්: 011-2187015
රිමේල්: nsemss@gmail.com

දෛනික ජීවිතයේදී
මව්බිම පාඨකයන් පිඩාවට
පත් කරන නීතිමය ප්‍රශ්න ගැන
සෑම බදාදා දිනකම 'ගෘහිණියගේ සභාවේ'
පිළිතුරු ලබාදේ. නීති ආධාර කොමිෂන් සභාවේ
විද්වත් නීතිඥ කණ්ඩායමක් විසින් එම පිළිතුරු
සම්පාදනය කරනු ලැබේ.
ඔබේ ගැටලුව මව්බිම ලීගල් ඒඩ්, නීති ආධාර
කොමිෂන් සභාව, 129, මහාධිකරණ සංකීර්ණය හෝ
අලුත්කඩේ, කොළඹ 12, දුරකථන 011 2433618 හෝ
ඊමේල් legalaidcommission1978@gmail.com
වෙත යොමු කරන්න.
උපදෙස් සහ ලිපි සැකසුම
නීතිඥ දර්ශිකා මඩුගල්ලේ
නීතිඥ නිලුණ කුමාරි විජේරත්න
නීති නිලධාරි
නීති ආධාර කොමිෂන් සභාව

GUIDELINE
Right එක දැනගෙන Fight කරන්න

නුස්න විරෝධී - ඔන්ලයින් පනත්වලට සිවිල් හා මාධ්‍ය සංවිධානවලින් විරෝධය

ආණ්ඩුව සම්මත කිරීමට නියමිත අණපනත්වලට එරෙහිව සමාජයක් ලෙස හැඟී සිටි යුතු බවත් යෝජිත ත්‍රස්න විරෝධී පනත් කෙටුම්පත පසා මාර්ගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන බවත් සිවිල් සංවිධාන හා මාධ්‍ය සංවිධාන චෝදනා කරයි.

ආණ්ඩුවේ නොහැකියාව වහගන්නයි මේ පනත් ගේන්නේ
- දුමින්ද සමිපත්

මේ ලෑස්ති වෙන්නේ සිවිල් සංවිධානවලත් වෘත්තීය සමිතිවලත් කට වහන්නයි
- ජෝසප් ස්ටාලින්

විරුද්ධ මත මොට්ට කරන්න මේ පනත් භාවිත කරන්න පුළුවන්
- ප්‍රබෝධ රත්නායක

මෙවැනි මර්දනකාරී පනත් පාර්ලිමේන්තුව තුළ පරාජය කිරීමට නොහැකි නමුත් මහජනතාවගේ හැඟීම්වලට හා මවුපියන් විරුද්ධ වුණොත් ඒක සුදුසු වෙන්නේ නැහැ. ඒ නිසා ප්‍රජාව පරාජය පසු හැකි බවද මවුපු පැවසුහ.

පාර්ලිමේන්තුවේ සම්මත කිරීමට යෝජිත ත්‍රස්න විරෝධී පනත් කෙටුම්පත සහ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත සඳහා මාධ්‍ය සංවිධාන, වෘත්තීය සමිති හා සිවිල් සංවිධානවල විරෝධය පළ කරමින් කාරාසේත්පිට ශ්‍රී ලංකා ප්‍රවෘත්තිපත් ආයතනයේදී පෙරේදා (02දා) විශේෂ මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන්නේ,

එතිහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති දුමින්ද සමිපත් මෙසේ කීය.

ඉතාමත් අභියෝගාත්මක අවස්ථාවක ආණ්ඩුව විසින් අපිට හොඳ අවස්ථාවක් හිරිමාණය කරලා දීලා තියෙනවා. සියලුම වෘත්තීය සමිතිවලට එක මේසයක ඉඳගෙන සාකච්ඡා කරන්න, වැඩේ ආණ්ඩුවේ මේදපනකාරී ක්‍රියාවලට පිළිතුරු දෙන්න. මේ මොහොතේ ඒක ශක්තිමත්ව පෙනෙන්න තියෙනවා. වෘත්තීය සමිති 18කට අධික සංඛ්‍යාවක සහභාගීත්වයෙන් එකම වේදිකාවක ආණ්ඩුවේ මේදපන නීතිවලට විරුද්ධව කටයුතු කරන්න පුළුවනකින් ඉන්නවා. මම හිතන්නේ මේ අවස්ථාව රෙජිතාත්මක අවස්ථාවක් කියලා. ආණ්ඩුව විසින් නීතිමාණය කරලා දුන්න මේ අවස්ථාව ප්‍රයෝජනවත් ගෙන මවුන්ගේ අරමුණු පරාජය කරමු.

මේ රෙජිතකාමී මේ සම්මිධානයේ දැනුවත් කළ යුතුයි ආණ්ඩුව මේ විදිහට හිමින් සැබෑ ගෙනැල්ලා දිදු කරන්න යන්නේ මොකද්ද කියලා. ඒ වගේම අපි කියනවා රනිල් ඊතුමෝගිගේ ප්‍රකාශයක ආණ්ඩුවට මෙවැනි අණපනත් ගෙනැල්ලා ජනමාධ්‍යවේදීන් මේදපන කරන්න කියලා. ඒ ප්‍රකාශය මුලින් ගන්නේ ජනතාව එක්ක වීදි බිහින්න ලෑස්තිව කියලා අපි පසෙදිවුම්ම කියනවා.

මේ කියන අණපනත් වහාම හකුළා ගන්න. එහෙම නොවුණොත් මේ රෙජි ඇතා භාෂණයේ ප්‍රකාශයෙන් නිදසුන වෙලලොත් ජනතාව පෙලඹන්නේම මේ වෘත්තීය සමිති එකට එකතු වෙලා වීදි බහිනවා කියලා අපි මොන්ද කරලා දෙනවා. මේ කාරණාව විශේෂයෙන් ජනමාධ්‍යවේදීන්ට විතරක් බලපාන කාරණාවක් නොමෙයි. සමාජ මාධ්‍යවල වගේම මුහුණුපොත්වල තමිවම භාවිත කරන කෙනකුට මේ නීති අණපනත් තමිත්ම බලපනවා. ආණ්ඩුව හදන්නේ ආණ්ඩුවේ නොහැකියාව, ඔවුන් ජනතාව පිට පටවන බර වහන්න මේ සමාජ මාධ්‍ය විතර වසුවාම හරි කියලා. ඒ නිසා ඒ තනන අපි ඉඩ දිය යුතු නැහැ කියලා අපි කියන්න ඕනේ.

පැමරල් සංවිධානය රෝහණ ගතිවිතාරවිව මෙසේ කීය.

දැන් මේ පනත් දෙපා හරයෙන් කියන්නේ ගන්නකම මේ ජනතාවට තමිගේ අදහස් ප්‍රකාශ කිරීමට රියෙන අයිතිය අහිමි කිරීමක් කරන්නේ, ආණ්ඩුව මතක තියා ගන්න මින කාරණය වෙන්නේ ඔබ අපා තියන්නේ මේ රෙදි මිලියන 22ක සමස්ත ජනතාවටයි. මේ සමාජ මාධ්‍ය භාවිත කරන ප්‍රජාණය බැහැලාත් ඔබ සෙල්ලම් කරන ප්‍රස්තාව කරන්නේ විශාල ජනතාවක් එක්ක. නිශ්චිත ඉලක්කගත කණ්ඩායමක් නෙමෙයි මේ පනත අදාළවා තියෙන්නේ මේ රෙදි සමස්ත ජනතාවම. මේ පනත් දෙක හරහා ඔවුන්ගේ අයිතිය පසහර හරවන ප්‍රස්තාව ගෙන තියෙනවා. ආණ්ඩුවේ මෙපමා නියෝජිතයන්ට අපි කියන්නේ ඔබ මේ පනත් දෙකම කියවන්න. ඔබ මොක් කරන්න පසුගිය මැතිවරණ කාලයේ සමාජ මාධ්‍ය භාවිත කළේ කොහොමද. ඔයින් මැතිවරණ අපයුතුණයට ඒවා භාවිත කළේ කියලා. මේ පනත් සම්මත වුණොත් ඔබට බලපන්න පුළුවන්. මොකද අපි දන්නවා මේ රෙදි මිලපන නියෝජිතයන් ගන්නොත් ඒ අය මේ ක්‍රක්‍රා කරලා තියෙන ප්‍රකාශ ගන්නොත් අපහය ප්‍රකාශ සමාජගත කිරීම යරිගේ මොකෝ කෙනෙක් අත්අඩංගුවට ගන්න පුළුවන්, අපි දන්නවා පසුගිය කාලයේ කොහොමද දේශපාලනය භාවිත වුණේ කියලා. මේ අමිති කරන්න ප්‍රස්තාව කරන්නේ මේ රෙදි ජනතාවට ප්‍රශ්න කරන්න තියෙන අයිතිය. අද මේ රට මේ තරම් ආර්ථික අගාධයකට ගිහිල්ලා තියෙන්නේ මේ රෙදි පැලකයන්ගේ අදාල්ලිතිපලනය නිසා. හැබැයි ඒවා ප්‍රශ්න කරන්න ජනතාව යොමු වෙන්නේ මේ සමාජ මාධ්‍ය භාවිතයෙන්. එතකොට ඒ ප්‍රශ්න කිරීම තමිගේ ඔවුන් හකුළන්න හදන්නේ. මේ පනත් දෙක සම්මත කරන්න කලින් මේ පනත් දෙක සම්පූර්ණයෙන්ම කියවලා බලන්න කියලා අපි මහජන නියෝජිතයන්ට කියනවා. මේකට ඔබ අත උස්සනවා නම් ඔබ සෑදුවම මේ රෙදි ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට එරෙහිව මේ රටේ පුරවැසියන්ගේ භාෂණයේ නිදහසට එරෙහිව තමයි අත උස්සන්නේ. ආණ්ඩුවේ සමහර ආමැතිරිදර කියනවා මේ පනත් දෙකෙන් ආගමික අත්තවාදය පැතිරීම වැළැක්වීම, ළමා හිංසනය හා ළමා අපචාරය සිදුවීම වැළැක්වීම වැනි සාධනීය කරුණු සඳහායි කියලා. අපි දැන්නවා සමාජයේ මේ දේවල් සිදුවෙනවා. ඒක පාලනය කරන්න අවශ්‍යයි. හැබැයි මේ පනත් දෙකේ අරමුණ මොකද්ද? මේ දැක්වා තියෙන්නේ මේ රෙදි පැලකයෝ මේ පනත් මේ නීති ක්‍රියාත්මක කරලා තියෙන්නේ තමන්ට එරෙහි සමාජ මතය යට කරන්න. ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය අහිමි කරන්න. ඒ නිසා අපිට මේ පැලකයෝ පිළිබඳ කිසිදු විශ්වාසයක් නැහැ.

ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝසප් ස්ටාලින් මෙසේ කීය.

මේ පනත හරහා පසෙදිවුම්වල යම්කිසි වීදිසක සමාජ මාධ්‍යයක පුද්ගලයකු ප්‍රාණ ජෝස්ට් එකක් සමාජ වීරෝධී ක්‍රියාවක්ද හැදීද කියලා තීරණය කරන්නේ රනිල් වික්‍රමසිංහ පත් කරන කමිටුවක්. ඒ කමිටුවේ ඉන්න පස්දෙනා තමයි තීරණය කරන්නේ මේ දාලා තියෙන එක හරිද වැරදිද කියලා. ඒ වගේම තමයි ප්‍රතිප්‍රස්ත පනත තුළ ත්‍රස්තවාදීය සඳුදා ත්‍රස්තවාදී ක්‍රියාව මොකක්ද කියලා තීරණය කරන්නේ හමුදාව හා පොලිසිය. එතකොට දැන් මේ පනත් දෙකේ සූධානමක් දේ තමයි ඕක. තුස්තවාදය ගැන තීරණය කරන්නේ රනිල් වික්‍රමසිංහ වෙනුවෙන් හමුදාව හා පොලිසියයි. අනිත් පැත්තෙන් සමාජ මාධ්‍යයේ දාන පෝස්ට් එකක් සම්බන්ධයෙන් ඒක හරිද වැරදිද කියලා තීරණය කරන්නේ රනිල් වික්‍රමසිංහ පත්කරන කමිටුවයි. මොකක්ද මේ වෙන්න යන්නේ, පසෙදිවුම්ම මේදපයකට